# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2371/45 – 2024 පෙබරවාරි 15 වැනි බ්‍රහස්පතින්දා – 2024.02.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2019/76

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2023.07.17 වැනි දින අංක 2341/05 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.07.11 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ආර්. එම්. නන්දන පුෂ්පකුමාර මයා, දියවැගිරෙන ඇල්ල, ස්ප්‍රිංවැලි.
2. කේ. එම්. කේ. සරත්චන්ද්‍ර මයා, අංක 120, වැලිකේමුල්ල, බදුල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.
2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, බදුල්ල ඩිපෝව, පස්සර පාර, හිඳගොඩ, බදුල්ල.

අතර පවත්නා 2023.06.23 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ එස්. ඒ. නිමල් සරණතිස්ස මයා වෙත යොමු කරන ලදී.


1A – G 41437 – 14 (2024/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරු නීතිඥ එස්. ඒ. නිමල් සරණතිස්ස මයා බේරුම්කාර ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2023.07.11 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

EOG 02 - 0115/1

---

මගේ අංකය: IR/COM/01/2019/76

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ආර්. එම්. නන්දන පුෂ්පකුමාර මයා, දියවැගිරෙන ඇල්ල, ස්ප්‍රිංවැලි.
2. කේ. එම්. කේ. සරත්චන්ද්‍ර මයා, අංක 120, වැලිකේමුල්ල, බදුල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.
2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, බදුල්ල ඩිපෝව, පස්සර පාර, හිඳගොඩ, බදුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 06, පොල්හේන්ගොඩ, එඩ්මන්ටන් නිවාස, XB 10/3, නීතිඥ ඩී. ජී. කේ. කරුණාරත්න මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2019/76

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ආර්. එම්. නන්දන පුෂ්පකුමාර මයා, දියවැගිරෙන ඇල්ල, ස්ප්‍රිංවැලි.
2. කේ. එම්. කේ. සරත්චන්ද්‍ර මයා, අංක 120, වැලිකේමුල්ල, බදුල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.
2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, බදුල්ල ඩිපෝව, පස්සර පාර, හිඳගොඩ, බදුල්ල.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

"2008 අංක 02 දරන මුදල් කොට්ඨාස චක්‍රලේඛය අනුව වැටුප් සකස් කිරීමේ දී ix ශ්‍රේණියේ වැටුප් පියවරේ තබා ගෙවා ඇති වැටුප වැරදි යයි පවසා viii ශ්‍රේණියේ වැටුප් පියවරේ තැබීම හේතුවෙන් වැඩිපුර ගෙවන ලදැයි පවසන රු. 229,084.60/- ක මුදල රු. 5,000/- වාරික වශයෙන් අඩුකර ගැනීම මගින් ආර්. එම්. නන්දන පුෂ්පකුමාර මහතාට හා කේ. එම්. කේ. සරත්චන්ද්‍ර මහතාට අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේ ද? යන්නත් පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 02 - 0115/2

---

මගේ අංකය: IR/COM/02/2023/90

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ශිල්ප ප්‍රදර්ශකයන්ගේ වෘත්තීය සමිතිය, අංක 42, රොද්‍රිගෝ පෙදෙස, කොළඹ 15.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, අංක 320, "ජනවතු පියස", ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පන්නිපිටිය, කළල්ගොඩ පාර, ජෝන් කීල්ස් නිවාස සංකීර්ණය, අංක 15, කැප්ටන් එම්. ජී. ජී. මෙන්ඩිස් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2023/90

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ශිල්ප ප්‍රදර්ශකයන්ගේ වෘත්තීය සමිතිය, අංක 42, රොද්‍රිගෝ පෙදෙස, කොළඹ 15.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, අංක 320, ''ජනවතු පියස'', ටී. බී. ජයා මාවත, කොළඹ 10.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

"ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සේවය කරන ඇමුණුම් 01 නම් ලැයිස්තුවේ ඇතුළත් නිලධාරීන්ට (46 දෙනාට) පහත දක්වා ඇති කරුණු හේතුවෙන් අසාධාරණයක් සිදුව ඇත් ද? අසාධාරණයක් සිදුවී ඇත්නම් ලැබිය යුතු සහනයන් කවරේ ද? යන්නත් පිළිබඳව වේ.

1. විධිමත් අභ්‍යන්තර උසස්වීම් ක්‍රමවේදයක් ලබා නොදීම.
2. සේවා ගණය නිශ්චිත ලෙස වර්ග නොකිරීම සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයට ඇතුළත් නොකිරීම.
3. ශිල්ප ප්‍රදර්ශක නිලධාරියෙකුගේ සේවා ධාරිතාවය ඉක්මවා යන පරිදි උපකරණ සහ යන්ත්‍ර වට්ටෝරු භාරගන්නා ලෙස බල කිරීම.''

ශිල්ප ප්‍රදර්ශකයින්ගේ වෘත්තීය සමිතිය සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය අතර පවත්නා ආරාවුල

ශිල්ප ප්‍රදර්ශකයින්ගේ වෘත්තීය සංගමයේ නාම ලේඛනය

1. එස්. එම්. කේ. සියසිංහ
2. එම්. ඩබ්. වඩුමුල්ල
3. එච්. මහානාම
4. කේ. ඩබ්. පී. එන්. දිල්ෂාන්
5. එම්. එස්. ඩී. කුරේ
6. එස්. ඒ. එස්. වික්‍රමසූරිය
7. කේ. පී. ඩී. කේ. කරුණානායක
8. පී. එස්. සාරංගි
9. එම්. එම්. සී. කවිරත්න
10. කේ. ඩී. ජයසිංහ
11. ඒ. එම්. එස්. ඩී. අලුගොල්ල
12. පී. එස්. එස්. කව්මිණි
13. ටී. එම්. එම්. අමරසේකර
14. ජී. ඒ. ඩබ්. ලක්ෂිකා
15. ඒ. වී. මද්දුමගේ
16. ඒ. ආර්. එම්. රුෂාන්
17. ආර්. එම්. රත්නවීර
18. ඒ. ආර්. සුහයිල් අහමඩ්
19. ඒ. උෂාන්ති
20. ඒ. එම්. ෂෆීක්
21. බී. සුරේෂ් කුමාර්
22. ඩී. ඒ. චමල් ඉමංක
23. ඩී. එම්. සී. එල්. දසනායක
24. ඩී. එම්. වයි. බී. දිසානායක
25. ඊ. ජේ. එම්. ඒ. විජේරත්න
26. ඊ. පවිත්‍ර
27. එච්. ඒ. ඉන්ෂාෆ්
28. ජී. ඒ. ඩී. මදූෂානි
29. ජී. එච්. ඩී. චානක
30. එච්. එම්. ටී. ගමගේ
31. එච්. එම්. එච්. කේ. කේ. හේරත්
32. අයි. ඩී. කේ. එස්. ජයලත්
33. ජේ. එම්. පී. ජයසිංහ
34. එල්. එච්. සමීර ප්‍රදීත
35. එල්. එස්. චතුරිකා
36. එම්. අරවින්තන්
37. එම්. එච්. පී. සමරසිංහ
38. එම්. පී. මධුසංකා
39. එම්. ඒ. අර්සද් අරීෆ්
40. පී. එච්. එම්. පී. ඩී. සිල්වා
41. පී. එච්. පී. නිලංග
42. එස්. ශිහානි
43. එස්. සී. එස්. සමරවික්‍රම
44. එච්. පී. එච්. කොඩිතුවක්කු
45. බී. ආර්. එල්. පෙරේරා
46. වයි. ආර්. ඒ. ප්‍රසාදී

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 දෙසැම්බර් මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 02 - 0116

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.